ක්‍රියාකාරකම 6- කොටස 2

ශ්‍රේණිය :7

වාරය: III

නිපුණතා මට්ටම (6.3.1): ශ්‍රී ලංකාවේ ඓතිහාසික තල් කොළ කර්මාන්තය ආශ්‍රිත කලා නිර්මාණ අගය කරයි.

ක්‍රියාකාරක: තල් කොළ නිර්මාණ අගයමු. උගනිමු.

තල් කොළ ඇසුරින් නිර්මිත භාණ්ඩ පහත පරිදි වර්ග කළ හැකි ය.

- පැදුර, පෙට්ටි, කඩහම් ( විශාල පෙට්ටි)
- කුල්ල
- 'උඟවල්', 'කොත්තු මූඩල්' ( මේවා පෙට්ටි විශේෂයකි)
- කුට්ටාන් ( හකුරු බහාලන උපකරණ)
- විලාසිතා ආභරණ
- බිත්ති සැරසිලි

තල් කොළ නිර්මාණ හස්ත කර්මාන්තයක් ලෙස සංවර්ධනය වී ඇත. ඒ සඳහා ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශ කිහිපයක් පහත දැක්වේ.

| නිර්මාණ | මඩකලපුව | යාපනය |
|---|---|---|
| පැදුරු | පාලමින්මඩු, තාලංකුඩා | වේලනෙයි, වරනි, අල්වායි |
| කුල්ල | පුදුක්කුඩියිරුප්පු | මානවලෙයි, මාහියප්පිට්ටි, සින්නමඩු |
| තොප්පි | තාලංකුඩා, තිරායිමඩු | මට්ටුවිල්, අල්ලරෙයි |
| මලු, කූඩ | කල්කුඩා, තාලංකුඩා | පෙට්ටි- එලුවෙයි තීවු, උඩුප්පිට්ටි, පුත්තූර් |

පැදුරු නිර්මාණය

- පැදුරු නිර්මාණයේදී විවීමේ ශිල්ප ක්‍රමය භාවිතා කරයි.
- තල් කොළ පැදුරු නිර්මාණ කටයුතුවල බහුල වශයෙන් නියැලෙන්නේ කාන්තාවන් ය.
- තල් කොළ පැදුරු වර්ග කිහිපයකි.
    - කදිර්පායි (අස්වනු පැදුරු) -කෘෂි කර්මාන්ත කටයුතුවල දී නෙළන ලද ගොයම් පෑගීමටත්, වී වේලීමටත්, තම්බන ලද වී වේලීවටත් භාවිතා පැදුරු
    - පඩුක්කේයි පායි (නිදන පැදුරු) - නිදා ගැනීමට ගත් පැදුරු
    - වර්ණපායි (පාට පැදුරු) - මංගල අවස්ථාවක් සඳහා විවිධ වර්ණවලින් නිර්මාණය කළ පැදුරු
    - පන්දිප් පායි ( උත්සව පැදුර)
    - සෝට්ටුප්පායි ( බත් පැදුර)

ඩී.කේ.දිලානි අලුත්ගෙදර මිය - ර/ හෝප්වෙල් විද්‍යාලය